"ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමේ ජාතික වැඩසටහන" - දේශීය නිෂ්පාදන කර්මාන්ත වැඩිදියුණු කිරීමේ සංවර්ධන කමිටු රැස්වීම් වාර්තාව
2021.01.15

"ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමේ ජාතික වැඩසටහන" යටතේ ක්‍රියාත්මක දේශීය නිෂ්පාදන කර්මාන්ත වැඩිදියුණු කිරීමේ සංවර්ධන කමිටු රැස්වීම, එම කමිටුවේ ප්‍රධානීන් වන ගරු කැබිනට් අමාත්‍යවරුන්ගේ හා රාජ්‍ය අමාත්‍යවරුන්ගේ ද දිස්ත්‍රික්කයේ ගරු අමාත්‍යතුමන්ලාගේ ද දිස්ත්‍රික්කයේ ගරු පාර්ලිමේන්තු මැති ඇමතිවරුන් හා දේශපාලන නියෝජිතයින් මෙන්ම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ රජයේ නිලධාරීන් හා විවිධ විෂයන් වලට අයත් ක්ෂේත්‍ර නියෝජනය කරන නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

දිස්ත්‍රික් ලේකම් විසින් පිළිගැනීමේ කතාව සහ ඉහත කමිටුවට අදාලව දිස්ත්‍රික්කයේ වර්තමාන තත්ත්වය පැහැදිලි කරන ලදි.

අනතුරුව වාරිමාර්ග ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමන් විසින් සභාවේ කටයුතු ආරම්භ කරමින් සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව දේශීය ආර්ථිකයක් නිර්මාණය කිරීම සඳහා පවතින අවශ්‍යතාවය පෙන්වා දෙමින් එක් එක් අමාත්‍යාංශවලට අදාලව අමාත්‍යාංශ විසින් මේ සඳහා කඩිනමින් ක්‍රියාමාර්ග ගතයුතු බවට දන්වන ලදි. මෙම සාකච්ඡාවේදී ලේකම්වරුන් විසින් එකී අමාත්‍යාංශ විසින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිදුකරන කාර්යයන් පිළිබඳව ඉදිරිපත් කිරීම් සිදුකල අතර දිස්ත්‍රික් ලේකම්තුමා විසින් ඉදිරිපත් කල කරුණු මෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කයට අදාල ගැටළු හා යෝජනා සම්බන්ධව ලබාදුන් අත්පොතෙහි ඇතුලත් කරුණු පිළිබඳවද, එම අවස්ථාවේ පැමිණසිටි අයගේ අදහස් හා යෝජනා ද සාකච්ඡාවට ගැනුණු අතර එක් එක් අමාත්‍යාංශ වලට අදාලව සාකච්ඡාවු කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/ යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 1.1.1 | කරදිය ධීවර කර්මාන්තය | දිස්ත්‍රික්කයේ ප්‍රධාන ධීවර වරායන් 4 ක් පැවතුනද අළෙවි අපහසුතා ඇතිවන අවස්ථාවලදී මත්ස්‍යයින් කල්තබා ගැනීම සඳහා ශීතාගාර පහසුකම් නොමැති වීම. | තංගල්ල සහ කුඩාවැල්ල වරාය ආශ්‍රිතව ශීතාගාර පහසුකම් ඇති කිරීම සුදුසු බවට තීරණය විය. | ධීවර අමාත්‍යාංශය |
| 1.1.2 | | මත්ස්‍ය අලෙවිසැල් අවිධිමත්ව පිහිටුවා ඇති අතර ඒවා විධිමත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව කරුණු ඉදිරිපත් විය | කුඩා මත්ස්‍ය අළෙවිසැල් ප්‍රමිතියෙන් යුතුව ක්‍රියාත්මක කිරීමට වැඩපිළිවෙලක් සකස් කිරීම අවශ්‍ය බවට තීරණය විය. | |
| 1.1.3 | | දිස්ත්‍රික්කය තුළ ධීවර යාත්‍රා බොහෝමයක් අබලන් තත්ත්වයේ පවතින බැවින් නව යාත්‍රා අවශ්‍යතාවය පිළිබඳව කරුණු ඉදිරිපත් විය. | අවශ්‍ය යාත්‍රා පහසු ක්‍රමයකට කඩිනමින් ලබාදීමට තීරණය විය. | |
| 1.1.4 | | කුඩාවැල්ල ධීවර වරාය ආශ්‍රිතව උම්බලකඩ නිෂ්පාදන බහුලව සිදුවන අතර ඉවත් කරන මත්ස්‍ය කොටස් වලින් ගැටලු රාශියක් ඇතිවන බවට කරුණු ඉදිරිපත් විය. එකී මත්ස්‍ය කොටස් යොදාගෙන සත්ව ආහාර සැකසීමට හැකි බැවින් මේ සඳහා පහසුකම් සැලසීමට යෝජනා විය. | කුඩාවැල්ල පමණක් නොව තංගල්ල ආශ්‍රිතවද මෙම ගැටළුව පවතින හෙයින් මේ සඳහා සුදුසු යාන්ත්‍රණයක් හඳුන්වා දීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් සැකසීමට තීරණය විය. | |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/ යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 1.1.5 | | ධීවරයින් සඳහා නිසි රක්ෂණ ක්‍රමයක් නොමැති බැවින් දායකත්ව රක්ෂණාවරණ ක්‍රමයක් ඇති කිරීම සුදුසු බවට තීරණය විය. | මේ පිළිබඳ විශේෂ අවධානය යොමු කර කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට තීරණය විය. | ධීවර අමාත්‍යාංශය |
| 1.1.6 | | කිරින්ද, හම්බන්තොට වරායන්වල අධික ලෙස වැලි තැන්පත්වීම නිසා ධීවර කර්මාන්තයට බාධාවන් සිදුවීම පිළිබඳ සාකච්ඡා වූ අතර වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ මේ පිළිබඳ සාකච්ඡා කරමින් පවතින බවත් ඉදිරියේදී විසඳුම් ලබාදීමට කටයුතු කරන බවටත් කරුණු ඉදිරිපත් විය. | එම කාර්යයන් කඩිනම් කිරීමට උපදෙස් ලබාදෙන ලදී. | ධීවර අමාත්‍යාංශය |
| 1.1.7 | | බිත්තර පොකිරිස්සන් සංරක්ෂණය කිරීමේ මධ්‍යස්ථානයක් නොමැති බැවින් මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට සුදුසු බවට යෝජනා විය. | මේ පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදී. | |
| 1.2.1 | මිරිදිය ධීවර කර්මාන්තය | වන ජීවී කලාප වල පිහිටි ධීවර තොටුපලවල කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු කිරීමට හැකියාවක් නොමැති බවට කරුණු ඉදිරිපත් විය. | අමාත්‍යාංශ මට්ටමින් සාකච්ඡා කර මේ සඳහා සාධනීය විසඳුමකට එළඹෙන ලෙස දන්වන ලදී. | විසිතුරු මත්ස්‍ය, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන්.... අමාත්‍යාංශය |
| 1.2.2 | | මිරිදිය ජලාශවල අනවසර මසුන් ඇල්ලීමේ ක්‍රම ක්‍රියාත්මකවන බැවින් මත්ස්‍ය නිෂ්පාදනය අඩුවන බවට කරුණු ඉදිරිපත් විය. | ආරක්ෂක අංශවලද සහයෝගය ඇතිව වැටලීමේ ක්‍රම ක්‍රියාත්මක කිරීම මෙන්ම ධීවරයින් සංවිධානය කිරීම මගින් හා දැනුවත් කිරීමෙන් එම ගැටළු විසඳා ගන්නා ලෙසට උපදෙස් දෙන ලදී. | |
| 1.2.3 | | මිරිදිය මත්ස්‍ය වගාව සඳහා දිස්ත්‍රික්කය තුළ විශාල විභවතාවයක් පැවතුනද මත්ස්‍ය වගාව සිදු වන්නේ ජලාශ කිහිපයක පමණක් බැවින් මත්ස්‍ය පැටව් තැන්පත් කිරීම තවදුරටත් වැඩිකලයුතු බවට අදහස් ඉදිරිපත් විය. | මේ පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදී. | |
| 1.2.4 | | මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයට අදාලව අගය එකතු කළ(Value Added) නිෂ්පාදන සිදු නොවන බවට කරුණු ඉදිරිපත් විය. | කරවල, උම්බලකඩ සහ විවිධ අගය එකතුකල නිෂ්පාදන සිදු කිරීමට අවශ්‍ය තාක්ෂණික දැනුම ධීවර පවුල්වලට ලබා දීම සුදුසු බවට තීරණය විය. | |
| 1.3. | විසිතුරු මත්ස්‍ය කර්මාන්තය | විසිතුරු මත්ස්‍ය වගාව දිස්ත්‍රික්කය තුල විසිරී පවතින බවත් අපනයන මට්ටම දක්වා වර්ධනය කළයුතු බවටත් කරුණු ඉදිරිපත් විය. | විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය දිරි ගැන්වීම සඳහා සහ අළෙවි පහසුකම් වැඩි කිරීම සඳහා නිෂ්පාදකයින් සහ අපනයන කරුවන් අතර සම්බන්ධතා ජාලයක් ගොඩනැගීම සුදුසු බවට දන්වන ලදී. | |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/ යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 1.4 | කරදිය හා මිරිදිය ධීවර කර්මාන්තය | දිස්ත්‍රික්කයේ ධීවර කටයුතු සම්බන්ධයෙන් පාරම්පරිකව සිදුකරන ලද කටයුතු වලට අදාලව ධීවර කෞතුකාගාරයක් ස්ථාපනය කිරීමට අවධානය යොමු කර යුතු බවට කරුණු ඉදිරිපත් විය. | මේ පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදී. | ධීවර අමාත්‍යාංශය/විසිතුරු මත්ස්‍ය, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන්..අමාත්‍යාංශය |
| 2.1.1 | පොල් වගාව | දිස්ත්‍රික්කය පුරාම පොල් වගාව පවතින අතර රතු කුරුමිණි හානිය සහ මයිටාවන්ගෙන් සිදු වන හානි වැළැක්වීමට නිසි ක්‍රමවේදයක් නොමැති වීම සහ පොහොර හිඟයක් පැවතිම පිළිබඳවද කරුණු ඉදිරිපත් විය. | කුරුමිණි සහ මයිටාවන්ගේ හානියට අවශ්‍ය බෙහෙත් ලබා දීම සිදු කළ හැකි බව සහ මේ වන විට ප්‍රමාණවත් පරිදි පොහොර පවතින බවත්, මිශ්‍ර පොහොර ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරන බවත් දන්වන ලදී.<br><br>මෙම රෝග සම්බන්ධව පොල් වගා කරුවන් දැනුවත් කිරීම සහ ක්ෂේත්‍ර පරීක්ෂණ ප්‍රමාණවත් නොවන බැවින් දැනට ක්ෂේත්‍ර නිලධාරීන් විධිමත්ව මෙම කටයුතු සඳහා යොදවන ලෙසද ග්‍රාමීය මට්ටමින් සංවර්ධන නිලධාරීන් සහ කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර නිලධාරීන් පුහුණු කර මෙම ගැටළුව විසදා ගන්නා ලෙස දැනුවත් කරන ලදී. | පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන.... අමාත්‍යාංශය |
| 2.1.2 | | රිලවුන්ගෙන්, වඳුරන්ගෙන් සහ දඩුලේනුන්ගෙන් පොල් ඵලදාව විනාශ වන බවට කරුණු ඉදිරිපත් විය. | තුවක්කු ලබා දීමේ කොන්දේසි ලිහිල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වන ලදී. | |
| 2.1.3 | | ප්‍රමාණවත් පරිදි පොල් පැල ලබා ගැනීමට හැකියාවක් නොමැති බැවින් මේ සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කළ යුතු බවට කරුණු ඉදිරිපත් විය. | එවැනි ගැටළුවක් පසුගිය කාලයේ පැවතුනද පොල් පැල තවාන් ප්‍රමාණය වැඩිකර මිලියන 04ක පැල ලබාදීමට කටයුතු කරන බවත් දන්වන ලදී. | පොල් වගා කිරීමේ මණ්ඩලය |
| 2.1.4 | | පොහොර හා ජලය යෙදීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කළමණාකරණය කරගෙන යන බවත් පොල් වගාකරුවන්ගේ ආදායම ඉහල නැංවීමට අතුරු භෝග වගාවන් හඳුන්වාදීම සහ ඊට අවශ්‍ය කටයුතු සිදු කරන බවට කරුණු ඉදිරිපත් විය. | පොල් ආදර්ශ වගාවන් සඳහා සුදුසු ස්ථාන හඳුනා ගනිමින් ස්ථාපිත කිරීමටත්, අතුරු භෝග වගාව පිළිබඳ උනන්දුවක් ඇති කිරීමට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දෙන ලෙස දන්වන ලදී. | පොල් වගා කිරීමේ මණ්ඩලය |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/ යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.2 | රබර් වගාව | පසුගිය කාලයේ රබර් මිල පහල යාම නිසා රබර් වගාවට ඇති උනන්දුව අඩු වුවද වර්ථමානයේ හොඳ මිලක් පවතින බැවින් මේ සඳහා වගා කරුවන් උනන්දු කළහැකි බවට කරුණු ඉදිරිපත් විය.<br><br>දිස්ත්‍රික්කයේ පවතින පාරිසරික තත්ත්වයන් සැලකිල්ලට ගෙන රබර් වගාව ව්‍යාප්ත කළ යුතු බවට කරුණු ඉදිරිපත් වූ අතර තවද, රබර් වගාව නිසි පරිදි නිලධාරීන්ගේ අධීක්ෂණයට හා උපදේශනයට ලක් නොවන බවටද කරුණු ඉදිරිපත් විය.<br><br>ෆයිනස් වගා කර ඇති භූමි වල පරිසරයට අහිතකර එම වගාව ඉවත් කර එම භූමිවල රබර් වගාව සිදු කරන ලෙස ඉල්ලීම් ඉදිරිපත් විය.<br><br>හම්බන්තොට වරාය ආශ්‍රිතව රබර් නිෂ්පාදන කර්මාන්ත ශාලා ස්ථාපිත වන බැවින් හම්බන්තොට හා මොණරාගල දිස්ත්‍රික්කවල රබර් වගාව ව්‍යාප්ත කිරීමේ කඩිනම් වැඩපිලිවෙලක් සකස් කරන ලෙස යෝජනා කරන ලදී. | දිස්ත්‍රික්කයේ පවතින විභවතාවන් හඳුනාගෙන රබර් වගාව ව්‍යාප්ත කිරීමට මෙන්ම නිලධාරීන්ගේ ක්ෂේත්‍ර පරීක්ෂණ හා උපදේශන වැඩි කරන ලෙසද මේ සඳහා ක්ෂේත්‍ර නිලධාරීන් ප්‍රමාණවත් ව නොමැති බැවින් ග්‍රාමීය මට්ටමේ සිටින අනෙකුත් නිලධාරීන්ගේ සහාය ද ලබා ගත යුතු බවට ද තීරණය විය.<br><br>එවැනි ඉඩම් හඳුනාගෙන තරුණ ප්‍රජාවට රබර් වගා කිරීම සඳහා බදු පදනම මත ලබාදීමට හා එම ඉඩම් වල අතිරේක භෝග වගාවට අවශ්‍ය සහාය ලබාදෙන ලෙස තීරණය විය. | සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත.....අමාත්‍යාංශය |
| 2.3.1 | තේ වගාව | තේ වගාව සිදු වන්නේ කටුවන සහ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පමණක් බවත්, ඒ සඳහා පොහොර ලබා ගැනීම දුෂ්කර බවට හා අළෙවි අපහසුතා පවතින බවට කරුණු ඉදිරිපත් විය. | පසුගිය කාලයේ පොහොර හිඟයක් පැවතුනද මේ වන විට එම ගැටළු විසදා ඇති බවත් වලස්මුල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානය මඟින් පොහොර ලබාගත හැකි බවත් දන්වන ලදී. | ජාතික පොහොර ලේකම් කාර්යාලය |
| 2.3.2 | | හඳුගල තේ කර්මාන්ත ශාලාව පසුගිය කාලවල වසා තිබුන ද දැනට ක්‍රියාත්මක වන බවට කරුණු වාර්තා විය. තවද මාතර දිස්ත්‍රික්කයේ වෙනත් තේ කර්මාන්තශාලා සඳහා දළු ලබා දීම සිදුවන බවත් ආසන්න කර්මාන්ත ශාලාවලට නිරන්තරව තේ දළු ලබා දීම තුළ එම කර්මාන්ත ශාලා ස්ථායීව පවත්වා ගැනීමට හැකි බවට කරුණු ඉදිරිපත් විය. | අළෙවි දුෂ්කරතා පවතීනම් එකී ගැටළු සොයා බලා කඩිනමින් විසදීමටද ක්ෂේත්‍ර නිලධාරීන්ගේ අධීක්ෂණ කටයුතු වැඩි කිරීමට ද තීරණය විය. | සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත.....අමාත්‍යාංශය |
| 2.3.3 | | තේ වගාව සඳහා ජල කළමණාකරණ ගැටළු පවතින බවට වාර්තා විය. | ජල කළමණාකරන පද්ධති හඳුන්වා දීමට සහ ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සූදානම් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය අය ඉල්ලුම් කරන ලෙස දැනුම් දෙන ලදී. | |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/ යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.4 | කිතුල් වගාව | කිතුල් වගාව දිස්ත්‍රික්කය පුරාම වගාවක් ලෙස නොමැති බවත් කටුවන, වලස්මුල්ල ප්‍රදේශවල කිතුල් කර්මාන්තය සිදු වුවද කැෂ්පර් තාක්ෂණය නොමැතිකම, නීතිමය බාධා හා කෘමි හානි නිසා ගැටලු මතුවී ඇති බවටද තොරතුරු වාර්තා විය.<br><br>කිතුල් වගාව වාණිජ වගාවක් ලෙස ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ලබාදීමට කටයුතු කලයුතු බවට කරුණු ඉදිරිපත් විය | රෝපණ ද්‍රව්‍ය ලබාදිය හැකි බවත්, කැෂ්පර් තාක්ෂණය ලබාදීමට ගැටළුවක් නොමැති බැවින් අවශ්‍ය අයගේ විස්තර කඩිනමින් ලබා දීමට තීරණය විය.<br>තවද කිතුල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා නීතිමය අවසරය මේ වනවිටත් ලබා දී ඇති අතර මේ පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කරන ලෙස වැඩිදුරටත් දන්වන ලදී. | පොල්, කිතුල් හා තල්.... අමාත්‍යාංශය /ප්‍රාදේශීය ලේකම්, කටුවන /වලස්මුල්ල |
| 2.5 | තල් වගාව | තල් ගස ආශ්‍රිතව විවිධ නිෂ්පාදනයන් සිදුකල හැකි බවත් දැනට තල් ගසෙන් උපරිම ඵල ලබා නොගන්නා බවටත් කරුණු ඉදිරිපත් විය<br><br>වීරවිල ප්‍රදේශයේ පමණක් තල් වගාව පවතින බවත්, එයින්ද විශාල ගස් ප්‍රමාණයක් පසුගිය වසරවල කපා දමා ඇති බවටද කරුණු අනාවරණය විය. එසේම, තල් වගාව යටතේ අතුරු භෝග වගා හඳුන්වාදීම පිළිබඳව යෝජනා ඉදිරිපත් විය.<br><br>හම්බන්තොට, කතරගම ආශ්‍රිතව තල් ගස් 25000ක් සිටුවීමට අවශ්‍ය කටයුතු සිදුකරන බවට කරුණු ඉදිරිපත් විය. | තල් ආශ්‍රිත නිෂ්පාදනයන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාගැනීමට අදාල පහසුකම් හා පුහුණුව, තාක්‍ෂණය හා ආධාර ලබා දීමට කටයුතු කරන බව දන්වන ලදි. | පොල්, කිතුල් හා තල්.... අමාත්‍යාංශය |
| 2.6 | බුලත් වගාව | සූරියවැව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුළ බුලත් වගාව හොඳින් පැවතුනද රෝගයක් බෝවීම හේතුවෙන් සම්පූර්ණ විනාශ වූ බවත් නැවත ඒ සඳහා නිවැරැදි තාක්ෂණික දැනුම ලබාදෙන්නේ නම් නැවත ආරම්භ කිරීමට වගාකරුවන් කැමති බවට කරුණු ඉදිරිපත් විය. | ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීමට හා එම වගාව දියුණු කිරීමට අවශ්‍ය සහාය ලබාදීමට කඩිනමින් කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදි. | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 2.7.1 | කුරුඳු වගාව | අපනයන කෘෂි භෝගවල පැල හිඟයක් පවතින බවට තොරතුරු වාර්තා විය. | තවාන් කරුවන් දිරිමත් කර පැල වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමට තීරණය විය. | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 2.7.2 | | සූරියවැව ප්‍රදේශයේ කුරුඳු වගාව සඳහා ප්‍රවනතාවයක් පවතින බැවින් ඒ සඳහා අවශ්‍ය සහාය බලාපොරොත්තුවන බවට කරුණු ඉදිරිපත් විය. | දිස්ත්‍රික් අපනයන කෘෂි භෝග ව්‍යාප්ති නිලධාරීන් පිළිබඳ තොරතුරු පලාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත ලබා දීමට තීරණය විය. | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/ යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.8 | කජු වගාව | දිස්ත්‍රික්කය පුරා විසිරුණු වගාවක් ලෙස ව්‍යාප්තව පවතින අතර පවතින නිෂ්පාදන සඳහා ස්ථාවර මිලක් හා වෙළඳපොළක් නොමැති වීම.<br><br>කජුවගාව සඳහා නව ඉඩම් හඳුනා ගැනීම සහ පැල ලබා දීමට කටයුතු කරන බවට කරුණු ඉදිරිපත් විය. | නව ඉඩම් හඳුනාගැනීම කඩිනම් කරන ලෙසත්, පවතින කජු වගා ඉඩම්වල අතුරු භෝග වගාව හඳුන්වාදීම සිදු කළ යුතු බව සහ ඊට අවශ්‍ය තාක්ෂණික දැනුම කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීන් මගින් ලබා ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | උක්, බඩ ඉරිඟු, කජු.....අමාත්‍යාංශය |
| 2.9 | අපනයන කෘෂි භෝග | අපනයන කෘෂි භෝග වගාව සඳහා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මැදිහත් වීම ප්‍රමාණවත් නොවන බවටද කරුණු ඉදිරිපත් විය | මේ සඳහා ආර්ථික සංවර්ධන, සමෘද්ධි සහ කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර යන නිලධාරීන් සඳහා දැනුම ලබාදීමට සුදුසු බැවින් ඒ සඳහා කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදී. | උක්, බඩ ඉරිඟු, කජු.....අමාත්‍යාංශය /අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 3.1 | කර්මාන්ත | බටඅත කර්මාන්ත පුරය ආශ්‍රිතව වාණිජ නිෂ්පාදන කටයුතු සිදු කරන කර්මාන්ත 10ක්, මිශ්‍ර (රබර්, ලුණු, කොහු, සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන සහ ලෝහ යනාදී නිෂ්පාදන කර්මාන්ත) හා ඒවා ආශ්‍රිතව රැකියා අවස්ථා 522 ක් පමණ උත්පාදනය වී ඇති බවත් පවසන ලදී.<br><br>කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා (SMILE III) - ණය යෝජනා ක්‍රමය සහ (E-Friend II) - ණය යෝජනා ක්‍රමය සහන පොලී අනුපාත යටතේ ආපසු ගෙවීම සඳහා වසර 02ක සහන කාලයක්ද සහිතව ක්‍රියාත්මක කරන බවට කරුණු ඉදිරිපත් විය. | කඩිනමින් අදාල කටයුතු සිදු කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදී. | කර්මාන්ත අමාත්‍යාංශය |
| 3.2 | | පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත ස්ථාන ලෙස දැනට හම්බන්තොට සහ කෙරවලපිටිය තෝරාගෙන ඇති බවට කරුණු ඉදිරිපත් කරන ලදී.<br>SLINTEC ආයතනය විසින් ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීමට තීරණය කර ඇති බව වැඩිදුරටත් පවසන ලදී. | | |
| | | තිස්සමහාරාම යාල ආශ්‍රිත ව සංචාරක කර්මාන්තය වැඩිදියුණු කළ හැකි තත්ත්වයක පවතින බවත්, ණය ලබා ගැනීමට යාමේදී ගැටළු පවතින බවත්, සංචාරක කර්මාන්තයේ කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයන් හඳුන්වා දෙන ලෙසට යෝජනා කරන ලදී.<br>කර්මාන්ත අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක කරන ණය සහතික කිරීමේ වැඩසටහන යටතේ බිම් මට්ටමේ පවතින ගැටළු සඳහා විසඳුම් ලබා ගත හැකි බව දන්වන ලදී. | බැංකු සමඟ සාකච්ඡා කර ණය වැඩසටහන් පහසු ක්‍රමයක් යටතේ ලබා දීම සඳහා කටයුතු කළ යුතු බව දන්වන ලදී.<br><br>සංචාරක කර්මාන්තය හා කර්මාන්ත අමාත්‍යාංශය අතර මනා සම්බන්ධීකරණයක් ඇති කර ගත යුතු බවට දන්වන ලදී. | කර්මාන්ත අමාත්‍යාංශය |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/ යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | කර්මාන්ත | හම්බන්තොට ආයෝජන කලාපයේ කටයුතු මාර්තු මස අවසානයේ ආරම්භ කරන බවත් එහි සිමෙන්ති, මෝටර් රථ,ඇඟළුම් කර්මාන්තශාලා, බැටරි, වානේ, ටයර් වැනි කර්මාන්ත ශාලා ඉදිකිරීමට අපේක්ෂා කරන බව දන්වන ලදී.<br>බටඅත ප්‍රදේශයේ කර්මාන්ත 12ක් පමණ ආරම්භ කර ඇති බව දන්වන ලදී. | මේ පිළිබඳව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡා කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | කර්මාන්ත අමාත්‍යාංශය |
| 3.3 | | යෝජිත නව විශේෂ ව්‍යාපෘති අතර ඛණිජ වැලි නිෂ්පාදනය ඉහළ නැංවීමේ වැඩසටහන පවත්වන බවට කරුණු ඉදිරිපත් කරන ලදී.<br>කිරින්ද - මාගම මුහුදු තීරයේ පවතින ඛණිජ වැලි නිධිය ගවේෂණය සහ කැනීම් කටයුතු සිදුකරන බව දන්වන ලදී. | කඩිනමින් අදාල කටයුතු සිදු කරණ ලෙසට උපදෙස් ලබා දෙන ලදී. | කර්මාන්ත අමාත්‍යාංශය |
| | | කර්මාන්ත ප්‍රවර්ධන පනතට අනුව කර්මාන්ත වැඩබිම් ලියාපදිංචි ගාස්තු අයකිරීමකින් තොරව කර්මාන්ත අමාත්‍යාංශය යටතේ කඩිනමින් ලියාපදිංචි කිරීම සිදු කරන බවත් එසේ ලියාපදිංචිවන කර්මාන්ත කරුවන්ට කර්මාන්තපුරවල ඉඩම් බදු පදනම මත ලබා දීම, අගය එකතුකළ නිෂ්පාදන සඳහා තීරු බදු සහ වැට් බදු පහසුකම් ලබා දීම, විදුලි බිල සඳහා සහනදායි අය කිරීම්, ජාත්‍යන්තර සහ දේශීය ප්‍රමිතිකරණය සහතික ලබා ගැනීමට සහාය වීම ඇතුළු සහන රැසක් ලැබෙන බවට කරුණු ඉදිරිපත් කරන ලදී. | කඩිනමින් අදාල කටයුතු සිදු කරණ ලෙසට උපදෙස් ලබා දෙන ලදී. | කර්මාන්ත අමාත්‍යාංශය |
| 3.4.1 | මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය | මැණික් පවතින ස්ථාන තිබුනද පතල් හා කැණීම් සම්බන්ධ විධිමත් වැඩපිළිවෙලක් හා නීතිමය අවසරයන් ලබා ගත නොහැකි බවටද කරුණු ඉදිරිපත් විය. | මැණික් ඇති ස්ථාන හඳුනාගෙන ඒ පිළිබඳ අවධානය යොමු කර සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීමට තීරණය විය. | මැණික් හා ස්වර්ණාභරණ .......අමාත්‍යාංශය |
| 3.4.2 | | මැණික් හා ස්වර්ණාභරණ නිෂ්පාදකයින් සඳහා අමුද්‍රව්‍ය හිඟයක් පවතින බවට කරුණු ඉදිරිපත් විය. | මේ වන විටත් ලියාපදිංචි වී ඇති නිෂ්පාදකයින්ට අධිකාරියේ මැදිහත්වීමෙන් සහන මිලට අමුද්‍රව්‍ය ලබා දීමේ වැඩපිළිවෙලක් පවතින බව දන්වන ලදී. | |
| 3.4.3 | | බෙලිඅත්ත කාර්මික විද්‍යාලයේ මීට අදාල පුහුණු වැඩසටහන් පැවැත්වෙන බැවින් අදාල පිරිස් මේ සඳහා සහභාගී කරවන ලෙස ඉල්ලා සිටින ලදී. | මෙම කර්මාන්තයට නවකයින් යොමු නොවීම නිසා නවකයින් ඒ සඳහා උනන්දු කරමින් වෙළඳපොළට ගැලපෙන අයුරින් විධිමත්ව පුහුණුව ලබා දෙන ලෙස අදාල ආයතන වලට උපදෙස් ලබා දෙන ලදී. | කර්මාන්ත අමාත්‍යාංශය |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/ යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 3.5.1 | මැටි කර්මාන්තය | මැටි නිෂ්පාදකයින්ට මැටි ලබා ගැනීමේ ගැටළු පවතින බවත් ප්‍රවාහනයේ දී පවතින නීතිමය තත්ත්වයන් ලිහිල් කල යුතු බවටත් යෝජනා ඉදිරිපත් විය. | කියුබ් 03ක් සඳහා අවසර දීම ප්‍රාදේශීය ලේකම් වෙත බලය ලබාදීමට නීති සංශෝධනය කර ඇති බව දන්වන ලදී. | වේවැල්,පිත්තල මැටි.......කර්මාන්ත ප්‍රවර්ධන අමාත්‍යාංශය |
| 3.5.2 | | වීරවිල වැව, තිස්ස වැව සහ දෙබරවැව ආශ්‍රිතව පවතින මැටි යන්ත්‍රසූත්‍ර යොදා ගනිමින් ලබා ගැනීමට අවසර ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. | වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ මැටි ඉවත් කරන විට ලබා ගත හැකි බව දන්වන ලදී. | |
| 3.5.3 | | මැටි කර්මාන්තය සඳහා පවතින දැනුම වර්ධනය නොවීම සහ තාක්‍ෂණය භාවිතයට අවස්ථා ප්‍රමාණවත් නොවන බවට කරුණු ඉදිරිපත් විය. | 2021 අයවැය යටතේ මේ සඳහා මුදල් වෙන් කර ඇති බවත් මේ සම්බන්ධයෙන් පුහුණුව, තාක්‍ෂණය සහ උපකරණ ලබා දීමට කටයුතු කරන අතර ඊට සුදුසු කර්මාන්තකරුවන් හඳුනාගන්නා ලෙස දන්වන ලදී. | වේවැල්,පිත්තල මැටි..කර්මාන්ත ප්‍රවර්ධන අමාත්‍යාංශය |
| 3.5.4 | | මැටි වල ස්වභාවය ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වන බැවින් කළ හැකි නිෂ්පාදනයන් ද ඒ අනුව වෙනස් වන ස්වභාවයක් ගන්නා බවත් මැටි නිධි ආශ්‍රිත තොරතුරු සපයන ලෙසත් දන්වන ලදී. | මැටි නිධි පවතින ස්ථාන පිළිබඳ දැන්වීමට තීරණය විය. මැටිවල ස්භාවය අධ්‍යයනය කර නිෂ්පාදන සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීමට තීරණය විය.<br><br>මැටි ප්‍රවාහනය සඳහා ලබා දී ඇති සහන ක්‍රම සහ ලබාදෙන අනෙකුත් පහසුකම් ද, ණය සහ ආධාර පිළිබඳ විස්තර ජනතාව වෙත දැනුවත් කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් වෙත දැන්වීමට තීරණය විය. | වේවැල්,පිත්තල මැටි..කර්මාන්ත ප්‍රවර්ධන අමාත්‍යාංශය/ ප්‍රාදේශීය ලේකම්වරු |
| 3.5.5 | | කැකිරිඕබඩ ප්‍රදේශයේ කිරිමැටි නිධියක් පවතින බවත් එය ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ කරුණු ඉදිරිපත් විය. | මේ පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දන්වන ලදී. | |
| 3.6 | ලාක්ෂා, පිත්තල කර්මාන්තය | ලාක්ෂා හා පිත්තල කර්මාන්තය සිදු කරන පාරම්පරික ගම්මාන කිහිපයක් පවතින අතර ඒ අයට අවශ්‍ය අමුද්‍රව්‍ය, නූතන තාක්‍ෂණික මෙවලම් සහ පුහුණුව ප්‍රමාණවත් නොවන බැවින් එම කර්මාන්තය අභාවයට යමින් පවතින බවට කරුණු ඉදිරිපත් විය. | මෙවැනි නිෂ්පාදන ගම්මාන නිරීක්‍ෂණය කර ගැටළු හඳුනාගෙන නිශ්චිත සැලැස්මකට අනුව එම කර්මාන්ත නඟා සිටුවීමට අදාල කටයුතු සිදු කරන ලෙස දන්වන ලදී. | වේවැල්,පිත්තල මැටි..කර්මාන්ත ප්‍රවර්ධන අමාත්‍යාංශය /ප්‍රාදේශීය ලේකම්වරු |
| 3.7 | වේවැල් ආශ්‍රිත නිෂ්පාදන | වේවැල් කර්මාන්තය සඳහා කර්මාන්ත කරුවන්ට අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටළු පවතින බවට කරුණු ඉදිරිපත් විය. | වේවැල් වගා කිරීමට සුදුසු ස්ථාන සොයා වගා කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. | |

මෙම රැස්වීමේ දී සාකච්ඡා කරන ලද ගැටළු හා යෝජනා සම්බන්ධයෙන් කඩිනම් පියවර ගන්නා ලෙස සියළු අමාත්‍යාංශ සහ ආයතන වලට දැනුම් දුන් අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලබා දී ඇති පොතෙහි එක් එක් ක්ෂේත්‍රයන්ට අදාල ගැටළු හා යෝජනා ද යෝජිත විසඳුම් ද යෝජනා කර ඇති බැවින් ඒ පිළිබඳ විශේෂ අවධානය යොමු කර ඉදිරි කටයුතු කරන ලෙස ද ඊට අදාල ප්‍රගතිය දිස්ත්‍රික් ලේකම් වෙත දන්වන ලෙසද වාරිමාර්ග අමාත්‍ය හා අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමණාකරණ ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා විසින් දැනුම් දීමෙන් අනතුරුව මෙම රැස්වීමට සහභාගී වූ සැමට ස්තුතිකර ප.ව 1.30ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය.

| | | |
|---|---|---|
| එම්.බී. චන්ද්‍ර නිමල්<br>අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) | අ/කළේ | ඩබ්ලිව්.එච්. කරුණාරත්න<br>දිස්ත්‍රික් ලේකම්/දිසාපති<br>හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය |

2021 ජනවාරි මස ...25... දින
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.